# වහකෝට්ටේ ජන සංස්කෘතිය ආශ්‍රිත පුදපූජා හා මිථ්‍යාවන් පිළිබඳ අධ්‍යයනයක්

මල්දෙණියේ ගෙදර තක්ෂිලා මල්දෙණිය

"ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනපති පරීක්ෂණය සඳහා සංස්කෘතික අධ්‍යයනය විෂය යටතේ ඉදිරිපත් කරන නිබන්ධය යි"

<u>අපේක්ෂකයාගේ ප්‍රකාශය</u>

මෙම ශාස්ත්‍රීය නිබන්ධය මහාචාර්ය බී.ඇම්. විජේතුංග මහත්මිය ගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත්, සහතික කරමි.

දිනය : ……………………………     ……………………………………………………………

මල්දෙණියේ ගෙදර තක්ෂිලා මල්දෙණිය

**GS/Mphil/CS/3959/09**

## උපදේශකතුමියගේ ප්‍රකාශය

මේ අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මේ නිබන්ධය ඇගැයීම් කාර්යය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත්, නිර්දේශ කරමි/කරමු.

දිනය : ............................ ............................................................

මහාචාර්ය බී. ඇම්. විජේතුංග

# අනුක්‍රමිකාව


අනුක්‍රමිකාව i-iii

උපකාරානුස්මෘතිය iv-v

නිබන්ධ සාරාංශය vi-ix

**පළමුවැනි පරිච්ඡේදය**

**1.** හැඳින්වීම 1-4

**1.1** සංස්කෘතිය 4-19

1.1.1 සංස්කෘතිය හැඩගැසීමට බලපාන සාධක 20-27

**1.2** උප සංස්කෘතිය 27-32

**1.3** ජන සංස්කෘතිය 32-34

1.3.1 ජනශ්‍රැතිය 34-42

1.3.1.1 ජනශ්‍රැති විෂය ක්ෂේත්‍රය 42-52

1.3.1.2 ජනශ්‍රැති ලක්ෂණ 53-58

1.3.1.3 ජනශ්‍රැති වලින් ඉටුවන මෙහෙවර 58-61

**1.4** මි : ‍යා විශ්වාස හා අභිචාරවිධි 61-69

**දෙවැනි පරිච්ඡේදය**

**2.** සාහිත්‍යය විමර්ශනය 70-70

**2.1** මුල්කාලීන කෘති 70-76

**2.2** සමකාලීන කෘති 77-91

**2.3** සාමාන්‍ය කෘති 91-113

**තෙවැනි පරිච්ඡේදය**

**3.** පර්යේෂණ මූලධර්ම 114-114

**3.1** පර්යේෂණ අරමුණ සහ පරමාර්ථ 114-114

**3.2** පර්යේෂණ ගැටලුව 114-116

**3.3** පර්යේෂණයේ වැදගත්කම 116-116

**3.4** අධ්‍යයන ක්‍රමවේදය 116-117

**3.5** අධ්‍යයනයේ විෂය සීමාව 117-118

**3.6** පරිච්ඡේදකරණය 119-121

**සිව්වැනි පරිච්ඡේදය**


**4.** වහකෝට්ටේ භූගෝලීය yd ඓතිහාසික පසුබිම 122-122

**4.1** භූගෝලීය පිහිටීම 122-125

**4.2** ග්‍රාම නාමය පටබැඳීම 125-129

**4.3** ඓතිහාසික තොරතුරු 129-138

4.3.1 පෘතුගීසින්ගේ පැමිණීම 139-139

**4.4** පෘතුගීසි සම්භවයක් ඇතිවීම සහ ජනාවාස පිහිටුවා ගැනීම 139-144

**4.5** පෘතුගීසි සමාජයක් බිහි කරවීම 144-147

4.5.1 භාෂාව හා සමාජය 147-150

**4.6** සමාජ සංවිධානය 150-150

4.6.1 ජනාවාස පැතිරීමේ ලක්ෂණ 150-156

4.6.2 ඥාතීත්වය 157-159

**4.7** ජනකතා 159-168


**පස්වැනි පරිච්ඡේදය**


**5.** සාමාජීය හා සංස්කෘතික පසුබිම 169-169

**5.1** ද්වාරකර්ම චාරිත්‍ර 169-169

5.1.1 නව නිවසක් ඉදිකිරීම 169-170

5.1.2 ඉඳුල්කට ගෑමේ උත්සවය 171-172

5.1.3 අකුරු කියවීම හෙවත් අත්පොත් තැබීම 172-173

5.1.4 දැරියක් වැඩිවිය පැමිණීම 173-175

5.1.5 විවාහය 176-179

5.1.5.1 කතෝලික විවාහ බන්ධනය ලැබීම 179-183

5.1.6 අවමංගල්‍යය 183-184

5.1.6.1 මරණය පිළිබඳ කතෝලික මතය හා වත්පිළිවෙත් 184-190

5.1.6.2 මළවුන් පිදීම 190-192

**5.2** ආර්ථිකය 192-194

5.2.1 කෘෂිකර්මාන්තය 194-194

5.2.1.1 කෘෂිකර්මය හා බැඳුණු විශ්වාස හා සිරිත් විරිත් 195-199

5.2.1.2 බීජ වී පැළකර ගැනීම හා අස්වනු නෙළීම දක්වා සම්බන්ධ චාරිත්‍ර වාරිත්‍ර 199-206

**හයවැනි පරිච්ඡේදය**


**6.** ආගමික විශ්වාස සමග බද්ධ වූ පුදපූජා හා අභිචාර විධි 207-211

**6.1** ආගමික පසුබිම 211-213

6.1.1 වහකෝට්ටේ ආගමික වර්ධනය හා විකාශනය 213-217

6.1.2 වහකෝට්ටේ ජනතාව හා කතෝලික චර්යා ධර්ම 218-220

**6.2** දේවස්ථානය හා සම්බන්ධ වාර්ෂික මංගල්‍යයන් හා වත්පිළිවෙත් 220-220

6.2.1 ගමේ මංගල්‍යය 220-223

6.2.2 මහා මංගල්‍යය 223-227

6.2.3 අලුත් සහල් මංගල්‍යය 227-228

6.2.4 වප්මඟුල් උත්සවය 228-231

6.2.5 වතුර සාත්තු කිරීම 231-231

6.2.6 කඩඉම් තහංචි කිරීම 231-232

6.2.7 චතාරික සමය 232-237

6.2.8 ප්‍රසාද නිධානය 237-237

6.2.9 දහතුන් අඟහරු දින භක්තිය - ත්‍රෙදෙවිනා 238-238

**6.3** කලාශිල්ප 238-240

6.3.1 මූර්ති කලාව හා සිතුවම් 240-252

**6.4** සංගීතය 252-253

6.4.1 පසම් හා ලතෝනි 253-257

6.4.2 දුක්ප්‍රාප්ති ප්‍රසංගය 257-259

**6.5** වාදනය 259-261


**හත්වැනි පරිච්ඡේදය**


**7.** සමාජ වෙනස්වීම 262-268

**7.1** වහකෝට්ටේ ජනතාවගේ සමාජ හා සංස්කෘතික වෙනස්වීම 268-285

7.1.1 සාමාජීය පසුතලය 285-286

7.1.2 ආර්ථික පරිවර්තනය 286-288

7.1.3 සංස්කෘතික විපර්යාසය 289-291

**7.2** සමාජ වෙනස්වීම අවම කරගැනීම 291-295

සමාලෝචනය 296-300

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 301-310

උපග්‍රන්ථ I ඡායාරූපාවලිය 311-319

උපග්‍රන්ථ II සම්පත් දායක නාමලේඛනය 320-320

# උපකාරානුස්මෘතිය


- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භාෂා හා සංස්කෘතික අධ්‍යනාංශයේ අංශ ප්‍රධාන තුමන් වන ආචාර්ය ප්‍රදීප් රත්නායක මහතාට ද,
- මානව ශාස්ත්‍ර අධ්‍යයන මණ්ඩලයේ සභාපතිතුමන් වන මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ මහතාට ද,
- මෙම පර්යේෂණ නිබන්ධය සම්පූර්ණ කර ගැනීමට අවශ්‍ය කරුණු පිළිවෙල සහ රටාව පිළිබඳ සාකච්ඡා කරමින් මාගේ මාතෘකාව අනුමත වූ අවස්ථාවේ පටන් ඒ හා සම්බන්ධ පරිච්ඡේද පිළිවෙලින් සකසමින් එහි වැරදි නිවැරදි කරමින් මෙම පර්යේෂණය සාර්ථක කර ගැනීම උදෙසා නිරන්තරයෙන් අනුබලය ලබාදුන් උපදේශකතුමිය වන මහාචාර්ය බී.ඇම්. විජේතුංග මහත්මියට ද,
- මෙම පර්යේෂණය සාර්ථකව ඉදිරිපත් කිරීම සඳහා විවිධ ආකාරයේ උපදෙස් හා දැනමුතුකම් ලබාදුන් සියලු විශ්වවිද්‍යාල ආචාර්ය මහත්ම මහත්මීන්ට ද,
- ඇඳුනුම්කම් ඇතිව මෙන්ම නැතිව ප්‍රශ්නමාලා පුරවා දෙමින් සම්මුඛ සාකච්ඡාවන්ට ඉදිරිපත් වෙමින් තමන්ට සාමාන්‍ය වූ තම ප්‍රදේශයේ තම ජාතියේ චාරිත්‍ර තම වෘත්තිය පිළිබඳ තමා පිළිබඳ තොරතුරු නොමසුරුව සපයාදීම වෙනුවෙන් දත්ත දයකත්වය දැරූ සැමට ද,
- දත්ත දයකයන් වෙතට මා හෝ ප්‍රශ්ණමාලා හෝ යොමු කරමින් විටෙක මාගේ සහායට මා සමඟ එක්වෙමින් තවත් අවස්ථාවක ඒ වෙනුවෙන් ඉඳුම් හිටුම් ආහාරපාන සපයමින් නන් අයුරින් සහය පළකිරීම වෙනුවෙන් පර්යේෂණයට සහාය වූ සැමට ද,
- විවිධ අභිචාරවිධි හා ආගමික මංගල්‍යයන්ට සහභාගි වීමේදී නොයෙක් ආකාරයේ උපදෙස් ලබාදුන් සහ ඒ සඳහා අවස්ථාව ලබාදුන් සැමට ද,
- ග්‍රාමීය වශයෙන් පවතින ආගමික අනන්‍යතා ලක්ෂණ පිළිබඳ හඳුන්වා දෙමින් විවිධ අදහස් දක්වමින් සහාය වීම වෙනුවෙන් ශුද්ධ වූ ශාන්ත අන්තෝනි මුනිතුමාගේ දේවස්ථාන භාර ප්‍රධාන පියතුමා වන යෝවාන් සවරිමුත්තු පියතුමාට ද,

- දේවස්ථානය හා මූලික වී කටයුතු කරන ග්‍රාමයේ වර්තමාන මුහුප්පුරාල තනතුර දරන දෙන් ස්ටීවන් විජේරත්න මහතාට ද,
- කිසිදු පසුබටවීමකින් තොරව කතෝලික පොත පත හා ග්‍රාමය පිළිබඳ විවිධ තොරතුරු සපයමින් ඓතිහාසික ස්ථාන පිළිබඳ විශේෂිත දත්ත පෙන්වාදුන් දෙන් ලියනාඩ් විජේරත්න මහතාට ද,
- ග්‍රාමයේ ඓතිහාසික ස්ථාන පිළිබඳ තොරතුරු දක්වමින් එම ස්ථාන පෙන්වාදෙමින් ග්‍රාමය පුරා සංචාරයේ යෙදෙමින් විවිධ පුද්ගලයින් හා සම්බන්ධ කරමින් තොරතුරු එක්රැස් කරගැනීම සඳහා උපරිම කැපවීමෙන් කටයුතු කළ දෙන් රොනී විජේරත්න මහතාට ද,
- ගලේවෙල උපදිසාපති කොට්ඨාස කාර්යාලයේ දිසාපතිතුමිය වන ඒ.එම්.කේ.සී.කේ. අතපත්තු මහත්මිය ද, සංස්කෘතික නිලධාරි එම්.පී. චන්ද්‍රානි රම්‍යලතා මහත්මිය ද, ක්‍රිස්තියානි ආගමික කටයුතු නිලධාරි ඇනස්ටා මාලනී විජේරත්න මෙනෙවිය ද, ඇතුලු විවිධ ආකාරයෙන් උදව් උපකාර කරනු ලැබූ කාර්යමණ්ඩලයේ සියලු මහත්ම මහත්මීන්ට ද,
- ග්‍රාමසේවක වසම් භාර නිලධාරින් වශයෙන් වහකෝට්ටේ- මුදිතා මහත්මියටද පිහිල්ලෙයාය- ආර්.පී.පී. රත්නායක මහතාටද ගල්ගොඩයාය- කේ.එල්. රංජිත් රත්නසිරි මහතාට ද,
- වහකෝට්ටේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම පර්යේෂණ නිලධාරින් වශයෙන් කටයුතු කරන විජේකෝන් මහතාට ද, එස්.ඩී. ජෝසප් සමරකෝන් මහතාට ද,
- මෙම නිබන්ධය යතුරු ලියනය කරදීම වෙනුවෙන් මාලක දිසානායක මහතාට ද,
- වචනයකින් හෝ සහාය ප්‍රකාශ කළ මා ඇසුරේ වන් හිතවත් සැමට ද,

  යන මේ සියලු පුණ්‍යවන්තයින්ට මා කළ සත්කාරයේ පිංපෙත් අනුමෝදන් කරමි.

මල්දෙණියේ ගෙදර තක්ෂිලා මල්දෙණිය

GS/Mphil/CS/3959/09

# වහකෝට්ටේ ජන සංස්කෘතිය ආශ්‍රිත පුදපූජා හා මිථ්‍යාවන් පිළිබඳ අධ්‍යයනයක්

මල්දෙණියේ ගෙදර තක්ෂිලා මල්දෙණිය

## නිබන්ධ සාරාංශය

"වහකෝට්ටේ ජන සංස්කෘතිය ආශ්‍රිත පුදපූජා හා මිථ්‍යාවන් පිළිබඳ අධ්‍යයනයක්" නැමැති මෙම ශාස්ත්‍රීය නිබන්ධයෙන් වහකෝට්ටේ ප්‍රදේශයේ ජනශ්‍රැතිකාංග යටතට අයත්වන මිථ්‍යා විශ්වාස හා අභිචාර විධික්‍රම ආදියෙහි ආරම්භය, ස්වරූපය, විකාශනය හා ඒ තුළින් සමාජයට වන බලපෑම් පිළිබඳව විවිධ අංශ යටතේ විග්‍රහයක යෙදේ. එමෙන්ම එවැනි අංශ මඟින් අධ්‍යාපනික හා සමාජ මානව විද්‍යාත්මක වශයෙන් ගැඹුරු හැඳින්වීමක් ඉදිරිපත් කිරීමට හැකි වූ අතර කතෝලික ධර්මයේ ආභාසය නොඅඩුව ලබා ගනිමින් පෝෂණය වී ඇති වහකෝට්ටේ ජන සංස්කෘතිය වූ කලී සුවිශේෂ වුවක් බව ප්‍රකාශ කිරීම මෙම නිබන්ධයේ මූලික පරමාර්ථය වේ. මෙවැනි සංස්කෘතිකාංග තුළ පවතින විශේෂත්වය වෙන් වශයෙන් ඉදිරිපත් කොට ඔවුන් සතු අනන්‍යතා ලක්ෂණ පිළිබඳව සමාජයට හඳුන්වා දීම මෙමඟින් ඉටුවේ. ඒ අනුව ජන නර්තනය, ජන ආගම, ජන සංගීතය, වෙදකම, ආගමික විශ්වාස, චාරිත්‍ර වාරිත්‍ර ආදී ජනශ්‍රැතිකාංග තුළ ගැබ්වී පවතින මිථ්‍යා විශ්වාස හා අභිචාර විධි සම්බන්ධව විමර්ශනය කිරීම ප්‍රමුඛස්ථානයක් ගනී. ජනශ්‍රැති අංග පිළිබඳව විමර්ශන කොතෙකුත් සුලභ වුවද වහකෝට්ටේ ප්‍රදේශයට ආවේණික ගති ලක්ෂණ පිළිබඳව කිසිදු පර්යේෂණයක් මෙතෙක් ඉදිරිපත් වී නොමැත. මෙවැනි සුළු ජන පිරිසක් කේන්ද්‍ර වූ සංස්කෘතිකාංග ඇසුරින් තම ජාතියට උරුම හර පද්ධති හා අගයන් ඉස්මතු කොට ඉදිරිපත් කිරීම මෙහිදී සිදුවේ. මෙවැනි සුවිශේෂ වූ ජන කොටස් පිළිබඳව පෘථුල දැනුම් සම්භාරයක් අපට ලබා ගත හැකි වන්නේ ඒ සම්බන්ධව ලිය වී ඇති කෘති පරිශීලනය කිරීමෙනි. මෙවැනි මානව කොටස් සම්බන්ධව සමාජ විද්‍යාත්මක පර්යේෂණ සිදු නොවුවහොත් එම සංස්කෘතික තොරතුරු ඒ අයුරින්ම සමාජයෙන් තුරන් වී යනු ඇත. මෙවැනි ජන කණ්ඩායම්වල සීඝ්‍රයෙන් ඇතිවන වෙනස්කම් හේතුවෙන් ඔවුන්ගේ ජන සමාජ තුළ සාම්ප්‍රදයිකව තිබූ සාරධර්ම,

අගයන්, විශ්වාස සහ සිරිත් විරිත් යන ආදිය වෙනස් වෙමින් පවතී. මේ ආකාරයට වහකෝට්ටේ වැසියන්ද සමාජ පරිවර්තනයකට ලක්වූ හා ලක්වෙමින් පවතින ජන කොටසක් වූ බැවින් ඔවුන් පිළිබඳ සමාජ මානව විද්‍යාත්මක විශ්ලේෂණයක් කිරීම කාලෝචිතයැයි මාහට හැඟී ගිය හෙයින් මෙම පර්යේෂණාත්මක අධ්‍යයනය කිරීමට පෙළඹුනෙමි. මෙවන් ජන කොටස් පිළිබඳව කරුණු එක්රැස් කොට තැබීම මඟින් සමාජ මානව විද්‍යා විෂය ක්ෂේත්‍රය පෝෂණය වීමට ලැබෙන පිටුවහල කිව නොහැකි තරම්ය. ඒ අනුව මාගේ පර්යේෂණය සඳහා "වහකෝට්ටේ ජන සංස්කෘතිය ආශ්‍රිත පුදපූජා හා මිථ්‍යාවන් පිළිබඳ අධ්‍යයනයක්" යන මාතෘකාව ඔස්සේ සමාජ මානව විද්‍යාත්මක විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට තෝරා ගත්තෙමි. මෙහිදී පර්යේෂණ ගැටලුව වශයෙන් යොදා ගනු ලැබුවේ වහකෝට්ටේ වැසියන්ගේ පුදපූජා, මිථ්‍යා විශ්වාස තුළින් ඔවුන්ගේ සමාජ ජීවිතය පවත්වා ගැනීම හා ඒවා සමාජ වෙනස් වීමට ලක්වීම පිළිබඳවයි. මෙම ගැටලුව නිරාකරණය සඳහා ක්‍රමවේදය කිහිපයක් භාවිත කළ අතර දත්ත එක්රැස් කිරීම සඳහා ලිඛිත හා අලිඛිත මූලාශ්‍ර කෙරෙහි අවධානය යොමු කෙරුණි.

මෙහිදී මාහට අවශ්‍ය වූයේ වහකෝට්ටේ ජන සංස්කෘතියට ආවේණික මිථ්‍යා විශ්වාස හා ආගමික අභිචාරකර්ම පිළිබඳ අවධානය යොමු කිරීම ප්‍රධාන අරමුණ වශයෙන් විග්‍රහ කිරීමටය. එමෙන්ම සමාජ විපර්යාසය හේතුකොටගෙන ඔවුන්ගේ පරිවර්තනය පිළිබඳ සාකච්ඡා කිරීම ද තවත් එක් අරමුණක් වේ. මෙම අරමුණු ඉටු කරගැනීමේ අපේක්ෂාවෙන් මූලාශ්‍ර පරිශීලනය, සම්මුඛ සාකච්ඡා, නියැදි භාවිතය ආදී ක්‍රමවේදයන් උපයෝගී කරගන්නා ලදි. පිහිල්ලෙයාය, ගල්ගොඩයාය, වහකෝට්ටේ යන ග්‍රාමසේවා වසම් මෙම පර්යේෂණය සඳහා පාදක කරගන්නා ලද භූමි ප්‍රදේශ වන අතර ආරම්භයේ දී මාතෘකාව පිළිබඳ හඳුන්වාදීමක් සඳහා යොමු විය. ඒ අනුව පර්යේෂණය සඳහා අවශ්‍ය සිද්ධාන්තමය රාමුව සකස්කරගැනීමට මා පෙළඹුනි.

මෙම නිබන්ධය ආරම්භයේ පළමු පරිච්ඡේදයේ දී සංස්කෘතිය හා ජනශ්‍රැතිය පිළිබඳ මූලික අවබෝධයක් ලබාදීමට උත්සාහ ගත් අතර ඒ යටතේ සංස්කෘතියේ මූලිකාංග, සංස්කෘතිය කෙරෙහි බලපාන සාධක හා ජනශ්‍රැති විෂය ක්ෂේත්‍රය, මිථ්‍යා විශ්වාස, අභිචාර විධි පිළිබඳ පුළුල් විග්‍රහයක යෙදේ. ඉන් අනතුරුව දෙවැනි පරිච්ඡේදයේදී සාකච්ඡාවට ලක්වන්නේ පර්යේෂණය සඳහා ආශ්‍රිත කරගනු ලැබූ ග්‍රන්ථ පිළිබඳ සමාලෝචනයකි. ඒ තුළින් මාගේ

මාතෘකාවට යම්කිසි පිටුබලයක් ලැබී ඇතැයි මා හට හැඟේ. එහිදී සාහිත්‍යය විමර්ශනය යටතේ මුල්කාලීන, සමකාලීන හා සාමාන්‍ය කෘති පිළිබඳ අන්තර්ගතය සම්බන්ධ විශ්ලේශණයක් ඉදිරිපත් කෙරේ.

තෙවැනි පරිච්ඡේදයේ දී නිබන්ධය හා සම්බන්ධ ප්‍රධාන අරමුණු විග්‍රහ කිරීම හා පර්යේෂණය සාර්ථක කරගැනීම සඳහා යොදගනු ලැබූ ක්‍රමවේද ඒ සඳහා පාදක වුණු ගැටලුව, පර්යේෂණයේ වැදගත්කම, විෂය සීමාව ආදී පර්යේෂණ මූලධර්ම පිළිබඳ සාකච්ඡා කෙරේ.

වහකෝට්ටේ භූගෝලීය හා ඓතිහාසික පසුබිම යටතේ භූගෝලීය වශයෙන් හරවත් කරුණු සමූහයක් සිව්වැනි පරිච්ඡේදය තුළදී ඉදිරිපත් කරන අතර වහකෝට්ටේ වැසියන් පෘතුගීසි සම්භවයක් පවතින ජන කොට්ඨාසයක් බවට මූලාශ්‍ර ඉදිරිපත් කරමින් එම කරුණු සනාථ කිරීම සඳහා සාධක දක්වයි. ඉන් අනතුරුව ඔවුන් ජනාවාස පිහිටුවාගැනීමේ සිට භාෂාව, ඥාති සම්බන්ධතාවය, ජනකතා ආදී අංශ යටතේ සාකච්ඡාවට බඳුන් කෙරේ. ඒ හා සම්බන්ධ මිථ්‍යා විශ්වාස පිළිබඳව විශේෂ අවධානය යොමු වේ.

ජන කොට්ඨාසයකට ආවේණික මූලික චාරිත්‍ර වාරිත්‍ර වශයෙන් නිවෙස් ආශ්‍රිතව සිදුකෙරෙන සියලු චාරිත්‍ර වාරිත්‍ර ද, දැරියක් වැඩිවිය පැමිනීම, විවාහය හා අවමංගල්‍යය ආදියෙහි ඉටුකරනු ලබන චාරිත්‍ර වාරිත්‍ර තුළ ගැබ් වී පවතින ආවේණික ගතිලක්ෂණ හා මූලික පරමාර්ථයන්හි පවතින වෙනස්කම් හඳුන්වාදීමට පස්වැනි පරිච්ඡේදයේදී අවධානය යොමු කරන අතර ඔවුන්ගේ ජීවන වෘත්තිය වන කෘෂිකර්මාන්තය සම්බන්ධ අභිචාර කර්මද සවිස්තරව දක්වයි.

හයවැනි පරිච්ඡේදයේදී අන්තෝනි මුනිතුමා වෙනුවෙන් පවත්වනු ලබන ප්‍රධාන මංගල්‍යයන්හි සිදුකරනු ලබන දුර්ලභ චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ විශේෂ අවධානය යොමු කිරීමට මා හට හැකි වූයේ, ක්ෂේත්‍ර පර්යේෂණයන්හි නියැලීම හේතුවනි. විශේෂයෙන්ම අන්තෝනි මුනිතුමන්ගේ ආගමික ලක්ෂණ බෞද්ධාගමික ලක්ෂණවලින් පෝෂණය ලැබී ඇති බව ප්‍රකාශ කළ යුතුය. මෙහිදී ශුද්ධ වූ ශාන්ත අන්තෝනි මුනිතුමා වෙනුවෙන් පවත්වනු ලබන පුදපූජා හා යාතුකර්ම පිළිබඳ විශේෂ අවධානය යොමු කිරීමට උත්සාහ ගත් අතර ඒ තුළින් ඔවුන්ගේ සමාජ ආචාරධර්ම තුළ පවතින විශේෂතා හඳුන්වාදීමට හැකිවිය. එමෙන්ම ආගමික සංකල්පය හා බද්ධවූ කලාශිල්ප ඒ හා සම්බන්ධ සංගීතය පිළිබඳව විශේෂ අවධානයක් මෙහිදී යොමු කොට ඇත.

වහකෝට්ටේ කිතුනු ගම්මානය ධනවත් සංස්කෘතිකාංගවලින් පොහොසත් වූ ජනශ්‍රැතියකට උරුමකම් පෙන්නුම් කරන සුවිශේෂ පිරිසක් වාසය කරන නිජභූමියකි. ඔවුහු දේශීය සංස්කෘතිය තුළ තම ආගම ජීවමාන කරගෙන තමන්ටම ආවේණික වූ චාරිත්‍ර වාරිත්‍රයන්ගෙන් යුක්ත වූවෝ වෙති. මේ අනුව ඔවුහු රටේ සෙසු කිතුනුවන් හා සසඳන කල පැහැදිලිව හඳුනාගත හැකි වෙනස්කම්වලින් පරිපූර්ණ වී ඇත. මොවුන් තුළ සිංහල ආභාසය මෙන්ම බෞද්ධ ආභාසයද විද්‍යාමාන වන බව නිබන්ධය අවසානයේ පැහැදිලි වේ. සමාජීය වෙනස්කම් පිළිබඳ කරුණු සඳහන් වන හත්වැනි පරිච්ඡේදයේදී මේ පිළිබඳ විග්‍රහයක යෙදේ.

මොවුන් පිළිබඳ සිදු කරන ලද පර්යේෂණ ආශ්‍රයෙන් පළ වූ ලිපි කිහිපයක් හමුවේ. නමුත් එම ලිපි තුළ විස්තර වන්නේ වහකෝට්ටේ කිතුනු ඉතිහාසය පිළිබඳවය. මේවා බොහොමයක් කිතුනු පූජකවරුන් රචනා කරන ලද අතර කිහිපයක් ලිපිලේඛන එකල මෙරට පාලනය කළ ඉංග්‍රීසි ජාතිකයන් විසින් වාර්තාගත කළ නිල ලේඛනයෝ වෙති. එහෙත් මාගේ අධ්‍යයනය මුල්කර ගනු ලැබුවේ ජනශ්‍රැතිය හා සංස්කෘතික වටිනාකම් පිළිබඳව හෙයින් වහකෝට්ටේ කිතුනුවන් කතෝලික දහම තම මව්රටේ පැවති උරුමයන් හා බද්ධ කරගැනීමේ ප්‍රයත්නය පිළිබඳව විශේෂ අවධානය යොමු වේ. මේ අනුව සමාජ පරිනාමය සමඟ ඔවුන් මුහුණ දෙනු ලබන දුෂ්කරතා මෙන්ම චාරිත්‍ර වාරිත්‍ර තුළ ඇතිවන පරිවර්තනයද ඊට ඔවුන් මුහුණ දෙනු ලබන ආකාරය පිළිබඳව ද විශේෂ අවධානය යොමු කිරීමට මාහට හැකිවිය. මෙසේ ඉදිරිපත් කෙරෙන කරුණු තුළින් එම ජන සමාජයේ අනන්‍යතාවය විදහා දක්වන අතර ඔවුන්ගේ සමාජ පද්ධතිය තුළ ගැඹුරු අර්ථකථනයක් ලබාදීමට හැකිවිය. ඒ අනුව මෙම පර්යේෂණ නිබන්ධය තුළින් ඔවුහු සතු සියලු ජන සංස්කෘතිකාංග පිළිබඳ හෙළිදරව් කිරීමක් සිදුවේ. එමෙන්ම අවසානයේ දී සමස්ත සමාලෝචනයක් ද ඉදිරිපත් කෙරේ.